පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව -

විෂය : විද්‍යාව

සතිය: 9

ශ්‍රේණිය : 6

සකස් කිරීම : මාවනැල්ල අධ්‍යාපන කලාපය

# කාලගුණය හා දේශගුණය

**කාලගුණය යනු,** කෙටි කාලයක් තුළ නිශ්චිත ස්ථානයක පවතින වායුගෝලීය තත්වයයි.


1. කාලගුණය පිළිබඳව රූපවාහිනී හා ගුවන් විදුලියේ එදිනෙදා තොරතුරු ප්‍රචාරය කරනු ලබයි. එහිදී ඔබ අසා ඇති තොරතුරු මොනවාද?
2. කාලගුණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේදී බහුලව භාවිත වෙන සාධක 5ක් නම් කරන්න.
3. පහත වගුව සලකන්න.

| නගරය | සාමාන්‍යය දෛනික උෂ්ණත්වය °C | | සාමාන්‍යය වාර්ෂික වර්ෂාපතනය (මි.මී.) |
|---|---|---|---|
| | උපරිම | අවම | |
| කොළඹ | 30.6 | 24.1 | 2519 |
| නුවර එළිය | 20.2 | 11.6 | 1709 |
| හම්බන්තොට | 30.0 | 24.0 | 1045 |

a) උෂ්ණත්වය අඩුම නගරය කුමක්ද?
b) උෂ්ණත්වය වැඩිම නගරය කුමක්ද?
c) වර්ෂාපතනය අඩුම නගරය කුමක්ද?
d) වර්ෂාපතනය වැඩිම නගරය කුමක්ද?
e) නුවර එළියේ වාර්ෂික වර්ෂාපතනය කොපමණද?

දේශගුණය යනු, නිශ්චිත ප්‍රදේශයක දිගු කාලයක් තිස්සේ පවතින වායුගෝලීය තත්ත්වයයි.

4.




**a) ඉහත ප්‍රස්ථාරයට අනුව උෂ්ණත්වය වැඩිම මාසය නම් කරන්න.**

b) උෂ්ණත්වය අඩුම මාසය නම් කරන්න.

c) **උෂ්ණත්වය එකම මට්ටමක පැවතෙන්නේ කුමන මාසවලද?**

5. කාලගුණ තොරතුරු ලබා ගන්නා උපකරණ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | මනින උපකරණය |
|---|---|
| වර්ෂාපතනය | |
| සුළඟේ දිශාව | |
| සුළඟේ වේගය | |
| ආර්ද්‍රතාව | |

6. කාලගුණ වෙනස්වීම් නිසා සිදුවන ස්වාභාවික ආපදා 5ක් නම් කරන්න,

7. මෙම පාඩම ඇසුරින් ඔබ උගත් කරුණු මතකයට ගෙන ඒ පිළිබඳ තොරතුරු එක්රැස් කර පොත් පිංචක් සකසන්න. එහි කාලගුණය , දේශගුණය කාලගුණික වෙනස්වීම්වලින් ඇතිවන ආපදා ,කාලගුණික තොරතුරු ලබා ගන්න උපකරණ *පිළිබඳ රූප තොරතුරු ඇතුලත් විය යුතුය.*